සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## පළමු වාර පරීක්ෂණය 2018

8 ශ්‍රේණිය

## බුද්ධ ධර්මය

කාලය පැය 02 යි

නම/ විභාග අංකයඃ

සැලකිය යුතුයි

- පළමු කොටසේ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. එක් ප්‍රශ්නයක් සඳහා ලකුණු දෙක බැගින් හිමිවේ.
- දෙවන කොටසේ පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

## I - කොටස

- අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට ගැලපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01 ''ඉඳ ඉඳ එක වෙහෙර - විඳ විඳ දහම් මනහර'' යන කවිය ඇතුළත් වන කාව්‍ය ග්‍රන්ථය කුමක් ද?

(1) ගුත්තිල කාව්‍යය (2) කාව්‍ය ශේඛරය

(3) සිරිත් මල්දම (4) බුදුගුණ අලංකාරය

02 සිදුහත් කුමරුගේ සොහොයුරා වූයේ,

(1) ආනන්ද කුමාරයා ය. (2) නන්ද කුමාරයා ය.

(3) අනුරුද්ධ කුමාරයා ය. (4) දේවදත්ත කුමාරයා ය.

03 බුදුරජාණන් වහන්සේ කනට සුව එළවන කථාබහ ඇති නිසා උන්වහන්සේ

(1) සඛිලය (2) සම්මෝදකය (3) අබ්භාකුටිකය (4) පුබ්බභාසීය

04 බුදුරජාණන් වහන්සේගේ අවසාන ශ්‍රාවකයා වූයේ,

(1) ආනන්ද කුමාරයා ය. (2) උපතිස්ස පිරිවැජියා ය.

(3) නන්ද කුමාරයා ය. (4) සුභද්‍ර පිරිවැජියා ය.

05 බුදුරජාණන් වහන්සේගේ ධර්මය මුල, මැද, අග තුන් තැනම යහපත් ය. එහි සැකකටයුතු කිසිවක් නොමැත. ධර්ම රත්නයෙහි පවත්නා එම ගුණය

(1) ස්වාක්ඛාත නම් වේ. (2) අකාලික නම් වේ.

(3) ඒහි පස්සික නම් වේ. (4) ඕපනයික නම් වේ.

- **අංක 06 සිට 10 දක්වා දී ඇති ප්‍රකාශය හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (✗) ලකුණ ද ඉදිරියෙන් දී ඇති වරහන තුළ යොදන්න.**

06 බුදුරජාණන් වහන්සේ අල්ප ශබ්දතාවය මහත්සේ අගය කළ සේක. ( )

07 තෙරුවන්හි ගුණ සූවිස්සක් වේ. ( )

08 බෞද්ධයෝ ආරක්ෂාව උදාකර ගැනීම පිණිස දානමය පින්කම් පවත්වති. ( )

09 රාග, දෝස, මෝහ සිතුවිලි යටපත් වීම බුදුගුණ භාවනාවේ ආනිසංසයක් නොවේ. ( )

10 සමථ භාවනාවට අයත්වන අනුස්සති ගණන දහයක් වේ. ( )

- **අංක 11 සිට 15 දක්වා ඇති වාක්‍යවල හිස්තැනට ගැලපෙන පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියන්න.**

(කිඹුල්වත් නුවර / රජගහ නුවර / ලෝකවිදූ / අස්සජි / මුගලන්)

11 සුදත්ත සිටුවරයා බුදුරජාණන් වහන්සේ හමුවූයේ ........................................................................................ දී ය.

12 දෙමාපිය අවසරයකින් තොරව දරුවන් පැවිදි නොකරන ලෙස බුදුරජාණන් වහන්සේ ශික්ෂා පදයක් පනවා වදාළේ ........................................................................................ දී ය.

13 දෙව් මිනිස් බඹ යන ලෝකවල සැබෑ තත්ත්වය අවබෝධ කළ බැවින් බුදුරජාණන් වහන්සේ ........................................................................................ නම් වන සේක.

14 ''යේ ධම්මා හේතුප්පභවා'' යන ගාථාවෙන් ධර්ම දේශනා කළේ ........................................................ මහරහතන් වහන්සේ ය.

15 කාලසිලාවට වැඩමවා එහිදී පිරිනිවන්පා වදාළේ ........................................................ මහරහතන් වහන්සේ ය.

- **අංක 16 - 20 දක්වා ප්‍රශ්නවල දී ඇති ප්‍රකාශය සම්පූර්ණ කිරීමට සුදුසු නිවැරදි පිළිතුර B තීරුවෙන් තෝරා එහි අංකය A තිරුවේ තිබෙන වරහනෙහි යොදන්න.**

| | A | | | B |
|---|---|---|---|---|
| 16 | සැරියුත් තෙරුන්ගේ ගිහි කල නම වූයේ | (...........) | 1. | සකුළුදායී පිරිවැජියා ය. |
| 17 | කථාබහ කරනවිට බුදුරජාණන් වහන්සේ තුළ පැවති විශේෂ ලක්ෂණ හයක් පෙන්වා දුන්නේ | (...........) | 2. | පොක්ඛරසාති බමුණු පඬිවරයා ය. |
| 18 | රජගහ නුවර සූකර ඛත ලෙනේදී වේදනා පරිග්‍රහ සූත්‍රය ඇසූයේ | (...........) | 3. | දීඝනක පිරිවැජියා ය. |
| 19 | ඡත්ත නම් තරුණයාගේ ආචාර්යවරයා වූයේ | (...........) | 4. | සෝණදණ්ඩ බමුණා ය. |
| 20 | තම ආරාමයට බුදුරජාණන් වහන්සේ වඩිනු දැක සිය පිරිස නිහඬකරවා ගත්තේ | (...........) | 5. | උපතිස්ස පිරිවැජියා යන්නය. |

(ලකුණු 2 x 20 = 40)

# II කොටස

- **පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5 කට පමණක් පිළිතුරු සපයන්න.**
- **පළමුවන ප්‍රශ්නයට ලකුණු 20 ක් ද, 02 සිට 07 දක්වා ප්‍රශ්නවලට ලකුණු 10 බැගින් ද හිමිවේ.**

01 කෙටි පිළිතුරු සපයන්න.

(i) ''රජෝ හරණං රජෝ හරණං'' යනුවෙන් කියමින් සුදු රෙදි කඩක් පිරිමැදීමෙන් පසු රහත් භාවයට පත් හිමිනම කවුරුන් ද?

(ii) මහනෙල් සුවඳම ය..... යන කවිය සම්පූර්ණ කර ලියන්න.

(iii) බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පෑවේ කොහේදී ද?

(iv) නිවසක පිරිත් පින්කමක් සිදුකිරීමේ දී පළමුව කළ යුත්තේ කුමක් ද?

(v) ප්‍රඥාවන්තයින් හා ඍද්ධිමතුන් අතර අග්‍රස්ථානයට පත් තෙරවරුන් දෙදෙනා නම් කරන්න.

(vi) ''ඇවැත් සුභද්‍රයෙනි භාග්‍යවතුන් වහන්සේ වෙහෙසට පත් නොකරන්න. උන්වහන්සේ ක්ලාන්තව වැතිර සිටිති.'' යනුවෙන් ප්‍රකාශ කළේ කවුද?

(vii) සිරිත් හා විරිත් යනු කුමක්දැයි කෙටියෙන් හඳුන්වන්න.

(viii) ධම්ම පදය නම් ග්‍රන්ථය අයත් වන නිකාය සහ එහි ඇතුළත් ගාථා ගණන සඳහන් කරන්න.

(ix) බුදුරජාණන් වහන්සේ ඇතුළු භික්ෂූන් වහන්සේලා පිරිසට වැඩ සිටීම සඳහා සුද්ධෝදන රජතුමා විසින් සාදවා දෙන ලද ආරාමය කුමක් ද?

(x) සිව්වනක් පිරිස නම් කරන්න. (ලකුණු 2 x 10 = 20)

02 (i) බුදුරජාණන් වහන්සේට මුහුණදීමට සිදුවූ ගැටළු දෙකක් නම් කරන්න. (ලකුණු 02 යි.)

(ii) දෙව්දත් තෙරුන් විසින් බුදුරජාණන් වහන්සේගෙන් ඉල්ලා සිටි පංචවර යාචනයෙන් තුනක් නම් කරන්න. (ලකුණු 03 යි.)

(iii) ඔබේ පන්ති කාමරයේ ඔබ අසලින් සිටින ශිෂ්‍යයකුගෙන් ඔබගේ අධ්‍යාපන කටයුතුවලට බාධා ඇතිවේයැයි සිතන්න. බුද්ධ චරිතයෙන් ආදර්ශ ගෙන මෙම ගැටළුව විසඳා ගත හැකි ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 05 යි.)

03 (i) ධර්ම රත්නයෙහි සඳහන් වන ගුණ දෙකක් වන අකාලික සහ ඒහිපස්සික යන දෙකෙහි තේරුම ලියන්න. (ලකුණු 02 යි.)

(ii) ධර්ම රත්නය වන්දනා කරන ගාථා පාඨය ලියන්න. (ලකුණු 03 යි.)

(iii) උතුම් මිනිසකු ලෙස කටයුතු කිරීම සඳහා බුදුරජාණන් වහන්සේ දේශනා කරන ලද ධර්මය ඔබගේ ජීවිතයට සම්බන්ධ කරගත හැකි ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 05 යි.)

04 (i) ''යෝච පුබ්බේ පමජ්ජිත්වා'' යන ගාථාව සම්පූර්ණ කර ලියන්න. (ලකුණු 02 යි.)

(ii) එම ගාථාවේ තේරුම ලියන්න. (ලකුණු 03 යි.)

(iii) එම ගාථාව ඇසුරින් ඔබගේ ජීවිතය ආලෝකවත් කරගැනීමට ලබාගත හැකි ආදර්ශ පාඨ පහක් ලියන්න. (ලකුණු 05 යි.)

05 (i) භාවනාව යනු කුමක්දැයි කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 02 යි.)

(ii) අරහං බුදු ගුණය යනු කුමක්දැයි පැහැදිලි කරන්න. (ලකුණු 03 යි.)

(iii) බුදුගුණ භාවනාවෙන් ඔබට ලැබෙන ප්‍රයෝජන පහක් නම් කරන්න. (ලකුණු 05 යි.)

06 (i) සිංහල බෞද්ධ චාරිත්‍ර දෙකක් නම් කරන්න. (ලකුණු 02 යි.)

(ii) ගෘහ ප්‍රවේශ මංගල්‍යය යනු කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 03 යි.)

(iii) අවමංගල උත්සවයකදී අනුගමනය කරනු ලබන බෞද්ධ සිරිත් විරිත් මොනවාදැයි පැහැදිලි කරන්න. (ලකුණු 05 යි.)

07 (i) අගසවු දෙනම නම් කරන්න. (ලකුණු 02 යි.)

(ii) අගසවු චරිත දෙක ඉගෙන ගැනීම තුළින් අපේ ජීවිතයට ලබාගතහැකි ආදර්ශ තුනක් නම් කරන්න. (ලකුණු 03 යි.)

(iii) කල්‍යාණ මිතුරන් ඇසුරු කිරීමෙන් ඔබගේ ජීවිතය සාර්ථක කරගත හැකි ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 05 යි.)

## පිළිතුරු පත්‍රය - I කොටස

(01) ගුත්තිල කාව්‍යය (02) නන්ද කුමාරයා ය. (03) සබිලය (04) සුභද්‍ර පිරිවැජියා ය.
(05) ස්වාක්ඛාත නම් වේ. (06) ✓ (07) ✓ (08) ✗ (09) ✗ (10) ✓
(11) රජගහ නුවර (12) කිඹුල්වත් නුවර (13) ලෝකවිදූ (14) අස්සජී (15) මුගලන්
(16) 5 (17) 4 (18) 3 (19) 2 (20) 1

## II කොටස

01 (i) චුල්ලපන්ථක හිමියන් (ලකුණු 02 යි.)
(ii) මහනෙල් සුවඳ මය
කුඩ මසු පිළී ගඳ මය
දෙකට එක දිය මය
හොඳට නරකට දෙකට කට මය (ලකුණු 02 යි.)
(iii) කුසිනාරා නුවර උපවර්තන සල් උයනේ දී (ලකුණු 02 යි.)
(iv) නිවසේ ස්වාමියා ගමේ විහාරස්ථානය කරා ගොස් දෑහැත් වට්ටියක් පිරිනමා මහ සඟ රුවනට ආරාධනා කොට පිරිත සඳහා දිනයක් නියම කර ගැනීම (ලකුණු 02 යි.)
(v) ප්‍රඥාවන්තයින් අතර - සැරියුත් තෙරණුවන් / ඍද්ධිමතුන් අතර - මුගලන් තෙරණුවන් (ලකුණු 02 යි.)
(vi) ආනන්ද තෙරණුවෝ (ලකුණු 02 යි.)
(vii) සිරිත් - කළයුතු දේ (චාරිත්‍ර) / විරිත් - නොකළයුතු දේ (වාරිත්‍ර) (ලකුණු 02 යි.)
(viii) ඛුද්දක නිකාය / ගාථා 423 යි. (ලකුණු 02 යි.)
(ix) නිග්‍රෝධාරාමය (ලකුණු 02 යි.)
(x) භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා (ලකුණු 02 යි.) (මුළු ලකුණු $2 \times 10 = 20$ යි.)

02 (i) දේවදත්ත තෙරුන්ගේ පංචවර යාචනය / කාන්තාවන් පැවිදි කිරීම / චුල්ලපන්ථක හිමියන් රහත්වීම / පැවිද්දේ කලකිරුණු නන්ද හාමුදුරුවන්ගේ සිද්ධිය (ලකුණු 02 යි.)
(ii) 1. භික්ෂූන් වහන්සේ ජීවිතාන්තය දක්වාම ආරණ්‍යකව විසිය යුතුයි.
2. භික්ෂූන් වහන්සේ ජීවිතාන්තය දක්වාමපිණ්ඩපාතයෙන් යැපිය යුතුයි.
3. භික්ෂූන් වහන්සේ ජීවිතාන්තය දක්වාම පංශුකූලික විය යුතුයි.
4. භික්ෂූන් වහන්සේ ජීවිතාන්තය දක්වාම වෘක්ෂමූලිකව විසිය යුතුයි.
5. භික්ෂූන් වහන්සේ ජීවිතාන්තය දක්වාම මස් මාංශ වැළඳීමෙන් වැළකී සිටිය යුතුයි. (ලකුණු 03 යි.)
(iii) ප්‍රශ්නයට අදාළව ලියා ඇති පිළිතුරට ලකුණු ලබාදෙන්න. (ලකුණු 05 යි.)

03 (i) අකාලික - ධර්මය මනාව ප්‍රගුණ කරන්නා හට සතියකින්. මාසයකින්, වසරකින් හෝ ඊළඟ භවයේ දී හෝ නොව ඒ මොහොතේදීම ප්‍රතිඵල ලැබිය හැකි නිසා
ඒහිපස්සික - මෙසේ එව බලවැයි නිර්භයව ප්‍රකාශ කළ හැකි නිසා (ලකුණු 02 යි.)
(ii) ස්වාක්ඛාතෝ භගවතා ධම්මෝ සන්දිට්ඨිකෝ
අකාලිකෝ ඒහිපස්සිකෝ ඕපනයිකෝ පච්චත්තං
වේදිතබ්බෝ විඤ්ඤූහීති (ලකුණු 03 යි.)
(iii) ප්‍රශ්නයට අදාළව ලියා ඇති පිළිතුරට ලකුණු ලබාදෙන්න. (ලකුණු 05 යි.)

04 (i) යෝච පුබ්බේ පමජ්ජිත්වා
පච්ඡා සෝ නප්පමජ්ජතී
සෝ ඉමං ලෝකං පභාසේති
අබ්භා මුත්තෝව චන්දිමා (ලකුණු 02 යි.)
(ii) යම් කෙනෙක් මුලදී පමා වුවත් පසුව නුවණින් විමසා බලා නොපමාව කටයුතු කරන්නේ නම් හෙතෙම වලාගැබින් මිදුණු පුන්සඳ මෙන් මේ මුළු ලෝකයම බබළවයි. (ලකුණු 03 යි.)
(iii) ප්‍රශ්නයට අදාළව ලියා ඇති පිළිතුරට ලකුණු ලබාදෙන්න. (ලකුණු 05 යි.)

05 (i) සිත එකඟ කර ගැනීම / සිත සන්සුන් කර ගැනීම (ලකුණු 02 යි.)
(ii) බුදුරජාණන් වහන්සේ සියලු කෙලෙසුන් දුරු කළ නිසාත්. රහසින්වත් පව් නොකළ නිසාත්, ආමිස පූජා හා ප්‍රතිපත්ති පූජා පිළිගැනීමට සුදුසු නිසාත් අරහං නම් වන සේක. (ලකුණු 03 යි.)
(iii) පෙළ පොතේ 34 වෙනි පිටුවෙහි ඇති ආනිශංස වලින් පහකට ලකුණු ලබාදෙන්න. (ලකුණු 05 යි.)

06 (i) අකුරු කියවීම, උපන්දින උත්සව, ගෘහ ප්‍රවේශ මංගල්‍යය. පිරිත් පින්කම, දානමය පින්කම්, අවමංගල චාරිත්‍ර. සරණ මංගල්‍යය (ලකුණු 02 යි.)
(ii) නව නිවසක් ඉදිකොට එහි පදිංචිය ආරම්භ කිරීම. (ගෙවැදීම) (ලකුණු 03 යි.)
(iii) ප්‍රශ්නයට අදාළව ලියා ඇති පිළිතුරට ලකුණු ලබාදෙන්න. (ලකුණු 05 යි.)

07 (i) සැරියුත් මහරහතන් වහන්සේ සහ මුගලන් මහරහතන් වහන්සේ (ලකුණු 02 යි.)
(ii) පෙළ පොතේ 46 වෙනි පිටුවේ තිබෙන කරුණු වලින් තුනක් ලියා තිබිය යුතුය. (ලකුණු 03 යි.)
(iii) ප්‍රශ්නයට අදාළව ලියා ඇති පිළිතුරට ලකුණු ලබාදෙන්න. (ලකුණු 05 යි.)